# මාතෘ දීමනාව

## හැඳින්වීම

**මෙය නගර සභාව විසින් ලබාදෙන ආධාරයක් වන අතර ආදායම් අවශ්‍යතාවයන් සැලකිල්ලට ගනිමින් INPS ආයතනය මගින් ලබා දෙනු ලැබේ.**

## අයදුම්පත් යොමු කල හැක්කේ කාටද

Segrate නගර සභාවේ ස්ථිර පදිංචිය හිමි පහත කාණ්ඩයන්ට අයත් **මව්වරුන්ට**:

- ඉතාලි ජාතික කාන්තාවකට හෝ ඉතාලි පුරවැසියෙකුගේ පවුලේ සාමාජිකාවකට
- යුරෝපා සංගමයේ කාන්තාවකට හෝ පවුලේ සාමාජිකාවකට
- සරණාගත හෝ ආරක්ෂණ තත්වය හෝ රැකියාවක් කිරීම මත ඉතාලියේ විසීමේ බලපත්‍රය හිමි විදේශීක කාන්තාවකට

## අයදුම් කලයුතු ආකාරය

**අදාල අයදුම්පත නිසි පරිදි පුරවා** Segrate නගර සභාවේ **සහතිකලත් විද්‍යුත් තැපැල** වන **segrate@postemailcertificata.it** වෙත යොමු කල යුතුයි. ඉල්ලුම් පත්‍රයට තම විසීමේ බලපත්‍රයෙහි පිටපතක් ඇමිණිය යුතු අතර විසීමේ බලපත්‍රය අලුත් කරමින් පවතිනවා නම්, තැපැල් කන්තෝරුවෙන් ලබාදෙන රිසිට් පතෙහි පිටපතක්ද ඇමිණිය යුතුයි. විසීමේ බලපත්‍රය අලුත් කර ඉදිරිපත් කරන තුරු, ඔබගේ අයදුම්පත තාවකාලිකව රදවා තබා ගනු ඇත. **මෙම ලියකියවිලි රැගෙන නගරසභාව වෙත පැමිණෙන්න එපා.**

**දරුවාගේ උපතෙන් හෝ දරුවෙකු හදා ගැනීමට ලබා ගන්නේ නම් , එම දරුවා පවුල් ඒකකයට එකතු වී මාස 6ක් ඇතුළත** අයදුම්පත ඉදිරිපත් කල යුතුයි.

මෙම මාතෘ දීමනාව ලබාගැනීමට නම් , ඉල්ලුම්කරුගේ ISEE අගය යුරෝ 17,416.66 ට වඩා අඩු විය යුතුයි.

2020 වර්ෂය සදහා යුරෝ 348,12 බැගින් මාසික වාරික 5කට සුදුසුකම් ලබන අතර, මෙය යුරෝ 1,740.60ක් ලෙස එකවර ලබා දෙයි.

අයදුම්පත අන්තර්ජාළය හරහා INPS ආයතනයට යොමුකරන අතර එකවර මුලු මුදලම ලබාදෙයි. **මේ නිසා මෙම මුදල ඔබගේ/ බද්ධ බැංකු ගිණුමට හෝ තැපැල් කන්තෝරුවේ ගිණුමට බැර කරනු ඇත. ඒ අනුව අයදුම්පතෙහි මුදල ලබා ගැනීමට අවශ්‍ය IBAN අංකය සටහන් කර එහි ජායාපිටපතක්ද අමුණන්න.**


<u>**යොමුවිය යුතු කාර්‍යාලය**</u>
**සාමාජ සේවා අංශය**
වියා ප්‍රීමා මාජ්ජියෝ, 20090, සෙග්‍රාතේ
serviziallapersona@comune.segrate.mi.it